# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1757/7 – 2012 මැයි 10 වැනි බ්‍රහස්පතින්දා – 2012.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 3/6/1/3/ජේ/88/ඊ/158.

නික/තෙලහැර විද්‍යාලයේ ක්‍රීඩා පිටිය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 1314 තෙලහැර ග්‍රාම නිලධාරී වසමේ තෙලහැර ගමේ පිඹුරු අංක අ.ග.පි. 1578 කැබලි අංක 116 දරන ප්‍රමාණයෙන් හෙක්. 2.029 පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම.

කැබලි අංක 116
ඉඩමේ නම: අඹගහමුල හේන හෙවත් අඹගහමුල වත්ත; විස්තරය: තෙලහැර විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සඳහා භාවිතා කරන ඉඩම; හිමිකම් කියන අය: ජනතා වතු සංවර්ධන මණ්ඩලය; ප්‍රමාණය: හෙක්. 2.029.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජුනි මස 27 වැනි දින පෙ.ව. 11.00 ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජුනි මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඒ. එම්. ආර්. ජේ. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

2012 අප්‍රේල් මස 25 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

05 - 577

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: ජීසීඑෆ්/අත්/එන්ජ්/47/එල්ආර්.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 03ජේ/89/එල්ආර්බී/75.

මහ කොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ ඇළ මාර්ග සංවර්ධනය සඳහා පහත විස්තර කර ඇති ඉඩම රජයට පවරාගෙන ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පවරාගන්නා ලද ඉඩමේ විස්තරය:

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොළඹ මහනගර සහා සීමාවේ, නාවල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 9176 හා 2011.12.19 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් දැක්වෙන මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.3597 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල.

1A – G 15997 – 410 (2012/05)

**කැබලි අංක 01**

ඉඩමේ නම: පට්ටියාවත්ත ගොවිපල; විස්තරය: ඉඩම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: නොදනී; ප්‍රමාණය: හෙක්. 0.3597.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2012 ජුනි මස 18 වැනි දින පෙ.ව. 10.00 ට රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ අංක 03 දරන ස්ථානයේ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටි ඉඩම් අත්කර ගැනීමේ කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජුනි මස 11 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

සී. ඩබ්. අබේසූරිය,<br>
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,<br>
මහකොළඹ ගංවතුර පාලනය කිරීමේ<br>
හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය,<br>
ශ්‍රී ජයවර්ධනපුර - කෝට්ටේ.

2012 මාර්තු මස 14 වැනි දින,<br>
මහ කොළඹ ගංවතුර පාලනය කිරීමේ හා<br>
පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති කාර්යාලය,<br>
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,<br>
වැලිකඩ,<br>
රාජගිරිය.

05 - 578

---

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: ව/18/56/2001/II.

වර්ෂ 2009 ක්වූ නොවැම්බර් මස 23 වෙනි දින අංක 1629/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 3718 දරන පිඹුරේ කැබලි අංක 78 කැබලි අංක 170, 171 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමි.

**කැබලි අංක 170**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 10-12 වයසැති පොල් ගස් 3ක්, අවු. 12-14 වයසැති අඹ ගසක්, අවු. 18-21 වයසැති කොස් ගසක් සහ අවු. 8-10 වයසැති පුවක් ගස් 3ක් ද ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ජාගොඩආරච්චිගේ ප්‍රියංක, අංක 128/1, තපෝවනාරාම පාර, මත්තුමගල, රාගම; ප්‍රමාණය:හෙක්. 0.0283

**කැබලි අංක 171**

ඉඩමේ නම: ගොරකගහවත්ත; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, වැසිකිලියක්, භූගත ළිඳක කොටසක්, අවු. 15-21 වයසැති පොල් ගස් 3ක්, අවු. 18-21 වයසැති කොස් ගසක්, අවු. 10-12 වයසැති තැඹිලි ගසක් සහ අවු. 10-12 වයසැති අඹ ගසක් ද ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ලාල් සිරිවර්ධන, අංක 31/40, තපෝවනාරාම පාර, මත්තුමගල, රාගම; ප්‍රමාණය: හෙක්. 0.0492

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ කැබලි අංක 170-171 දක්වා 2012 ජුනි .මස 06 වෙනි දින පෙ.ව. 10.00ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2012 ජුනි මස 06 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

චන්දිමා දිසානායක,<br>
ප්‍රාදේශීය ලේකම්.<br>
වත්තල.

2012 .මැයි මස 09 වැනි දින,<br>
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී.

05 - 579

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.